# ලංසු කැඳවීම
# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
# GNSS උපකරණ සඳහා මිල ගණන් කැඳවීම - 2026
# ලංසු අංකය - SD/VI/2026

1. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් GNSS Instrument සඳහා මිල ගණන් කැඳවීම සඳහා සුදුසුකම් ලත් සහ සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| විස්තරය | GNSS උපකරණ 75 (අවම) ක් සඳහා |
|---|---|
| **ඇස්තමේන්තුගත වටිනාකම (රු.)** | 87,000,000.00 |
| **ලංසු සුරක්ෂණ (රු.)** | 870,000.00 |
| **ලංසු සුරක්ෂණය වලංගු කාලය** | 2026-10-09 දින සිට 2027-01-21 දින දක්වා වලංගු විය යුතු ය. |
| **ආපසු නොගෙවන ලංසු පත්‍ර ගාස්තුව (රු.)** | 18,000.00 |
| **ලංසු කැඳවීමේ ලේඛන කට්ටලය සහ අයදුම්පත කාර්යාල වේලාවන් තුළ ලබාගත යුතු දිනය සහ වේලාව** | 2026-09-18 වන දින සිට 2026-10-08 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා |
| **පූර්ව ලංසු රැස්වීම** | 2026-09-28 දින පෙ.ව. 10.00 ට සර්වේයර් ජනරාල් කාර්යාලයේදී |
| **ලංසු තැබීම අවසන් කිරීම** | 2026-10.09 දින පෙ.ව. 11.00 |
| **ලංසු විවෘත කිරීම** | 2026-10-09 දින පෙ.ව. 11.05 ප්‍රසම්පාදන හා සැපයීම් අංශය |
| **ලංසු වලංගු කාලය** | 2026-10-09 දින සිට 2026-12-24 දක්වා වලංගු විය යුතු ය. |

2. ඇස්තමේන්තුගත පිරිවැය ඉහත වගුවෙහි පරිදි වේ.
3. ඇණවුම ලැබී මාස 02 (සති 08) ක් තුළ සැපයීම කල යුතු ය. මෙම වසරේ ප්‍රතිපාදන යටතේ මිලදී ගැනීම් සිදු කළ යුතු බැවින් ගිණුම් පියවන දිනෙන් ඔබ්බට දින දීර්ඝ සලකා බලනු නොලැබේ.
4. ලංසු තැබීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය මගින් සිදු කෙරේ.
5. උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්) | snrsspns@survey.gov.lk ගෙන් වැඩිමනත් තොරතුරු ලබා ගෙන පහත සඳහන් ලිපිනයේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වූ කාර්යාල වේලාවන් තුළ ප්‍රසම්පාදන ලේඛන පරීක්ෂා කළ හැකි ය.
6. සුදුසුකම් අවශ්‍යතා හා අමතර විස්තර ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇති අතර සියළුම උපදෙස් හා විධිවිධාන පිළිබඳව සැළකිළිමත් විය යුතුය.
7. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක් ඉහත වගුවෙහි සඳහන් පරිදි ආපසු නොගෙවන ගාස්තුවක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට ගෙවීමෙන් පසු මිලදී ගත හැකි ය.
8. ලංසු පහත ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ පහත ලිපිනයෙහි පිහිටි අදාළ ලංසු පෙට්ටියටම බහාලිය යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. පහත ලිපිනයට පෞද්ගලිකව පැමිණ සහභාගී වන ලංසුකරුවන් / නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කෙරේ.
9. ලංසුපත් ඉදිරිපත් කිරීමේ දී අදාළ අයිතමය සඳහා ගෙවන ලද ලංසු සුරක්ෂණය/ ලංසු සුරක්ෂණයේ පිටපතක් ඇතුලත් මුද්‍රාතබන ලද කවරයේ ඉහල වම් කෙලවරේ "**GNSS උපකරණ සඳහා මිල ගණන් - 2026**" ලෙස සටහන් කළ යුතුය.

**ඉහත වගන්තිවල සඳහන් වන ලිපිනය:** ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්), සර්වේයර් ජනරාල් කාර්යාලය, නො: 150, කිරුළ පාර, කොළඹ 05. | දුරකතන / ෆැක්ස්: 0112 -368106 | snrsspns@survey.gov.lk

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු වෙනුවෙන්
ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
2026-09-18

C:\USERS\STORES-048.SURVEY\DESKTOP\GNSS PAPER ADD\MAIL-GNSS\PAPER NOTICE SINHALA.DOCX